ඔබ උහුද් කන්ද මෙන් රත්රන් වියදම් කළ ද, ‘කද්ර්’ හෙවත් ඔබ පෙර නියමය විශ්වාස කරන තෙක් හා ඔබට අත් වූ දෑ ඔබට වැරදෙන්නට තිබූ දෙයක් නොවූවක් බවත් ඔබට වැරදුනු දේ ඔබට ලැබෙන්නට තිබූ දෙයක් නොවූවක් බවත් ඔබ වටහා ගන්නා තෙක් අල්ලාහ් ඔබෙන් එය පිළිගන්නේ නැත. මේ හැර වෙනත් තත්ත්වයක ඔබ මියයැදුණේ නම් ඔබ නිරා ගින්නේ වැසියන් අතරට පත් වනු ඇත.

ඉබ්නු අද්-දයිලමී විසින් මෙසේ වාර්තා කරන ලදී. මම උබෙයි ඉබ්නු කඃබ් තුමා වෙත පැමිණ ‘මගේ සිත තුළ පෙර නියමය ගැන යමක් පවතී. එබැවින් මාගේ සිතෙන් එය අල්ලාහ් පහකරනු වස් යමක් මට කියා දෙන්නැයි අසා සිටියෙමි. එවිට එතුමා මෙසේ පැවසීය. “ඔබ උහුද් කන්ද මෙන් රත්රන් වියදම් කළ ද, ‘කද්ර්’ හෙවත් ඔබ පෙර නියමය විශ්වාස කරන තෙක් හා ඔබට අත් වූ දෑ ඔබට වැරදෙන්නට තිබූ දෙයක් නොවූවක් බවත් ඔබට වැරදුනු දේ ඔබට ලැබෙන්නට තිබූ දෙයක් නොවූවක් බවත් ඔබ වටහා ගන්නා තෙක් අල්ලාහ් ඔබෙන් එය පිළිගන්නේ නැත. මේ හැර වෙනත් තත්ත්වයක ඔබ මියයැදුණේ නම් ඔබ නිරා ගින්නේ වැසියන් අතරට පත් වනු ඇත.” තවදුරටත්
හෙතෙම: මම අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද්, හුදෙයිෆා ඉබ්නු අල් යමාන් සහ සෙයිද් ඉබ්නු
සාබිත් යන උතුමන්ලා වෙත ගියෙමි. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පවසා තිබෙන බව ඔවුන් සියලු දෙනාම මට දන්වා සිටියෝය. [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉබ්නු මාජාහ් එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත - අහ්මද්
එය වාර්තා කර ඇත]

අබ්දුල්ලාහ් ඉබ්නු ෆයිරෑස් අද්-දයිලමී (රහිමහුල්ලාහ්) විසින් මෙසේ වාර්තා කරන ලදී. සැබැවින්ම ඔහුගේ සිත තුළ ‘කද්ර්’ හෙවත් පෙර නියමය ගැන ගැටලුවක් පැවතිනි. එය ප්රතික්ෂේප කිරීමට තමන්ව යොමු කරනු ඇතැයි ඔහු බිය විය. මෙම ගැටලුව විසදා ගැනීම සඳහා ඔහු උගත් සහාබාවරුන් වෙත ගියේය. දේවත්වය විශ්වාස කරන්නෙකු තමන්ට ගැටලුවක් ඇති වූ විට ‘නුඹලා නොදන්නෙහු නම් දැනුමැත්තන්ගෙන් විමසනු’ යන අල්ලාහ්ගේ ප්රකාශය ක්රියාත්මක කිරීමක් ලෙස එසේ දැනුමැත්තන්ගෙන් විමසා සිටීම අත්යවශ්යය වන්නේය. පසුව එම විද්වත්හු සියලු දෙනාම පෙර නියමය හා ඉරණම විශ්වාස කිරීම අනිවාර්යය බවත් කොපමණ ප්රමාණයක් තමන් වියදම් කළ ද පෙරනියමය විශ්වාස නොකන අයගෙන් ඒවා පිළිගන්නේ නැති බවත් කවරෙකු එය විශ්වාස නොකරන තත්ත්වයේ මිය ගියේද ඔහු නිරා ගින්නේ වැසියන් බවට පත්වන බවත් විශ්වාස කිරීම අනිවාර්යය වේ යැයි තීන්දු දුන්හ.

http://www.sunnah.global/hadeeth/si/show/5954